# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/13 - 2018 ඔක්තෝබර් මස 02 වැනි අඟහරුවාදා - 2018.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/83II.

### 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත

### 11 වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 11 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්, ජයකොඩි ආරච්චිගේ සුමිත් වන මා විසින්, මහජනයාගේ හිත පිණිස සහ පළිබෝධ නාශක තාක්ෂණික සහ උපදේශක කමිටුවේ උපදේශය මත, මේ නියමය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය දරන සක්‍රීය රස ද්‍රව්‍යය අන්තර්ගත වන පළිබෝධ නාශක සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෑම බලපත්‍රයක්ම, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් සුළු වශයෙන් වෙනස් කරනු ලැබේ.

පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්.

පේරාදෙණිය.

I වන උපලේඛනය

| *රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය* | *සක්‍රීය රස ද්‍රව්‍යය* |
|---|---|
| 1071-83-6 | ග්ලයිෆොසේට් |

II වන උපලේඛනය

මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය දරන සක්‍රීය රස ද්‍රව්‍යය අන්තර්ගත වන සෑම පළිබෝධ නාශකයකම මෙහි පහත වගුවේ නිශ්චිතව දක්වා ඇති සහකාරක ද්‍රව්‍යය රහිත විය යුතු අතර එකී පළිබෝධ නාශකය තේ සහ රබර් වගාවන් සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය.

| *රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය* | *සහකාරක ද්‍රව්‍යය* |
|---|---|
| 61791-26-2 | පොලිඔක්සිඑතිලීන් ඒමයින් |

10-626

1A - PG 4258 - 307 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.